# රණවිරුවන්ට ලබාදෙන ඉඩම් සංවර්ධනය කිරීම සඳහා කොන්දේසි මාලාව

01. මෙම ඉඩම ලබාදෙනු ලබන්නේ රණවිරු නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා වන බැවින් ඉඩම් කොටසේ මායිම් ඔබ වෙත පෙන්වාදුන් දින සිට / තාවකාලික හිමිකම් සහතිකය ඔබ වෙත ලබාදුන් දින සිට තෙමසක් ගත වීමට පෙර ස්ථිර වැටක් සකස් කළ යුතුය.

02. ඉහත දින සිට වසරක් ගතවීමට ප්‍රථම නිවසේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතු වන අතර වසර දෙකක් ගත වීමට ප්‍රථම එම නිවසේ පදිංචි විය යුතුය. (ග්‍රාම නිලධාරි සහතික හා ඡන්ද හිමි නාම ලේඛන මගින් පදිංචිය තහවුරු කිරීමේ හැකියාව තිබිය යුතුය.)

03. ඉහත සඳහන් පරිදි තෙමසක් ඇතුළත වැටක් සකස් නොකරන හෝ වසර දෙකක් ඇතුළත පදිංචි නොවන ප්‍රතිලාභින්ගේ ඉඩම් හිමිකම අහෝසි කරනු ලැබේ.

04. තමා සතුව ඉඩම් හෝ නිවාස නොමැති බවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඉඩම් ලබා ගැනීමට උත්සාහ කරන බවට හෙළිදරව් වන ප්‍රතිලාභින්ගේ ඉඩම් හිමිකම අහෝසි කරනු ඇත.

05. රජයේ ඉඩම් බැහැර කිරීමේ නීති රෙගුලාසි අනුව හැර වෙනත් කිසිම හේතුවක් මත මෙම ඉඩම් කොටස විකිණීම හෝ අන් අයෙකුට පැවරීම කළ නොහැක.

06. ඔබගේ ඉඩම් කොටස සඳහා ඉහත දෙවැනි කොන්දේසියේ සඳහන් පරිදි පදිංචිය තහවුරු කිරීමෙන් පසු බලපත්‍ර / දීමනාපත්‍ර ලබා දීමට කටයුතු කරනු ඇත.

07. ඉහත සඳහන් කොන්දේසි යටතේ කටයුතු නොකරන ප්‍රතිලාභින්ගේ ඉඩම් කොටස් ආපසු රජයට පවරා ගැනීමට කටයුතු කරනු ඇත.